**<u>Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)</u>**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විරුද්ධව හිජාස් ඔමර් හිස්බුල්ලා සහා සලීම්කාන් මොහොමඩ් ශාකීල්* (පාස්කු ප්‍රහාරය හා එහි පසුබිම් සිදුවීම් සබැඳිව ගොණු කරන ලද නඩුවකි.)

**Case no (නඩු අංකය):** HC 78/2021

**Courts (අධිකරණය):** පුත්තලම මහාධිකරණය

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2024 ජනවාරි මස 16 වන දින

**Author (s) of report (වාතර්ාවේ කතෘ හෝ කතෘන්):** එම්.එම්.කේ කුරේ.

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | නදී අපර්ණා සුවන්දුරුගොඩ විනිසුරුතුමිය | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාතර්මේන්තුව)** | රජයේ නීතිඥ කල්හාර ගුණවර්ධන මහතා<br><br>නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ලක්මිණී ගිරිහාගම මෙනවිය<br><br>නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සුදර්ශන ද සිල්වා මහතා | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව/ත්‍රස්ත විමශර්න ඒකකය/ වෙනත්)** | | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | 1. හිජාස් ඔමර් හිස්බුල්ලා<br><br>2. සලීම්කාන් මොහොමඩ් ශාකීල් | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | 1 වන චූදිත වෙනුවෙන් නීතිඥ අසිත් සිරිවර්ධන මහතා පෙනී සිටින ලදී.<br><br>දෙවන චූදිත වෙනුවෙන්ද නීතිඥ චමින්ද අතුකෝරල මහතා, නීතිඥ හෆීල් ෆාරිස් මහතා සහ තවත් නීතිඥවරුන් පෙනී සිටින ලදී. | |
| **Aggrieved party (අගතියට පත් පාශර්වය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |

| | | |
|---|---|---|
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | මාධ්‍යවේදීන්, විදේශිකයන්, කතෝලික පූජකවරුන්, නීති ශිෂ්‍යයන් | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

මෙදින පැමිනිල්ලේ සාක්ෂි අංක 76 සාක්ෂියට කැඳවන ලදී. එනම්, රංග ශ්‍රීනාත් අබේවික්‍රම දිසානායක මහතාය. එම මහතා බලපිටිය මහාධිකරණයේ වර්තමාන විනිසුරුතුමන්ය. එතුමන් මූලික ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දෙමින් පහත සාක්ෂි ලබා දෙන ලදී.

මෙම විනිසුරුතුමන් 2004 ඔක්තෝම්බර් 15වන දින සිට 2020 සැප්තැම්බර් මාසය දක්වා මහේස්ත්‍රාත්වරයෙකු ලෙස සේවය කළ බවත්, 2020 මැයි මස අතිරේක මහේස්ත්‍රාත් කොළඹ (කොටුව මහේස්ත්‍රාත්) ලෙස සේවය කළ බවත් සඳහන් කරන ලදී.

මෙම විනිසුරුතුමන් විසින් 13101/19 නඩු අංකය යටතේ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සටහන් කර ගත් බව සඳහන් කරන ලදී. (එම ප්‍රකාශ ඇතුළත් ලිපිගොනුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙන්, මෙම පුත්තලම මහාධිකරණයට එවා ඇති අතර, එය පෙරදී මෙම අධිකරණයේදී විවෘත කර ඇත.මතකය අලුත් කර ගැනීම සඳහා එම ලිපි ගොනුව සාක්ෂිකරුට පෙන්වන ලද නමුත්, සාක්ෂි ලෙස එම ලිපිගොණුව ලකුණු කිරීමක් සිදු නොවීය)

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂකවරියක් වන M.T.M ගිම්හානි මැණිකේ මහත්මිය මෝෂන් පත්‍රයකින් කරන ලද ඉල්ලීමක් මත එම ප්‍රකාශ සටහන් කරගන්නා ලද බව සඳහන් කරන ලදී.

අවුරුදු 18ට අඩු දරුවන් ප්‍රකාශ දුන් අතර ඔවුන් වෙනුවෙන් නීතිඥවරුන් පෙනී සිටින ලද බවටත්, එම දරුවන් ප්‍රකාශ දීමේදී එම නීතිඥවරුන් නිලමැදිරියේ සිටි බවටත්, මධුකා දිල්හානී අමරසිංහ මහත්මිය යතුරුලියනකරු වශයෙන් එම අවස්ථාවේ කටයුතු කළ බවටත්, M.L.R මොහොමඩ් භාෂා පරිවර්තකවරයකු වශයෙන් එහි සිටි බවටත්, නීතිඥ මනෝහර ද සිල්වා, නීතිඥ තුසිතා නාමිනි සිල්වා සිටි බවටත්, පොලිස් නිලධාරීන් එම අවස්ථාවේ නොසිටි බවටත් සඳහන් කරන ලදී.

මොහොමඩ් නසාර් මොහොමඩ් මලික්ගේ ප්‍රකාශය ප්‍රථමයෙන් සටහන් කරගෙන ඇත. ප්‍රකාශය සටහන් කරගැනීමට පෙර, ප්‍රකාශය ස්වේච්ඡාවෙන් කරන්නේද යන්න මෙම නඩුවේ සාක්ෂිකාර එකළ මහේස්ත්‍රාත්තුමන් විමසා ඇත. එහිදී ස්වේච්ඡාවෙන් ප්‍රකශය දෙන බව දන්වා ඇත. සිංහල භාෂාවෙන් ප්‍රකාශය ලබා දී ඇති අතර භාෂා පරිවර්තකයකුගේ සහය ලබාගෙන නැත.

ප්‍රකාශයක් සටහන් කරගන්නා විනිසුරුතුමන් විට ඇඳන් සිටි ඇඳුම් පිළිබඳවද ප්‍රශ්න කරන ලදී. එහිදී Coat එක ඇඳන් සිටීමක් සඳහන් කරන ලදී.නිළ කාමරයට ඇතුළුවන විට දකුණු පස තිබෙන සාක්ෂිකර විනිසුරුතුමන්ගේ ලියන මේසයෙදී, එතනට පරිගණකයක් සවිකර එම අවස්ථාවේදීම ප්‍රකාශ යතුරු ලියනය කරගෙන ඇති බවට සඳහන් කරන ලදී.

1 වන සාක්ෂිකරුට හොඳින් සිංහල තේරෙන නිසා සිංහල භාෂාවෙන් තේරුම්කර දුන් බවටත් සඳහන් කරන ලදී.

මොහොමඩ් ෆලී මොහොමඩ් ෆවුසාන්ගේ ප්‍රකාශය සටහන් කරගත්තේ පෙර ප්‍රකාශය සටහන් කරගත් පරිදිම බවටත්, ඊට අමතරව මොහුගේ ප්‍රකාශය ගැනීමේදී භාෂා පරිවර්තකයෙකුගේ සහය ගන්නා ලද බවටත්, එහි සෑම පිටුවකම සාක්ෂිකාර විනිසුරුතුමන් අත්සන් කළ බවටත්, එම ප්‍රකාශ මුද්‍රා තබා රෙජිස්ට්‍රාටර්වරයාට දුන් බවටත්, ඒවා සේප්පුවේ තැබූ බවටත්, සාක්ෂිකාර විනිසුරුතුමන් ලඟත් ඒවායේ පිටපතක් තිබෙන බවටත් සඳහන් කරන ලදී.

නඩුවට අදාළ ලේඛන මහාධිකරණයට යොමුකරන ලද ලිපි කවර පෙන්වන ලද අතර, එහි ඇත්තේ සාක්ෂිකරුගේ අත්අකුරු නොවන බවට පවසන ලදී.

අනතුරුව 1 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීම සිදු විය. එකී හරස ප්‍රශ්න වලදී පහත කරුණු සඳහන් විය.

ප්‍රකාශකරුගේ ස්වේච්ඡාභාවය සම්බන්ධයෙන් සටහන් කරගෙන තිබෙන බවත්, සාක්ෂිකරුගේ ස්වේච්ඡාභාවය පිළිබඳ ප්‍රකාශය සටහන් කරගැනීමට පෙර ඔහු කොහේ ඉදන්ද එන්නේ, කාත් එක්කද පැමිණියේ ආදිය ඇහුවද? යන්න සාක්ෂිකාර විනිසුරුතුමන්ගෙන් විමසන ලදී. එහිදී, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය ප්‍රකාරව කරුණු දක්වන ලදී.එහි ඕනෑම තැනැත්තකු කරන ප්‍රකාශ ගැන සහ සැකකරුවකු කරන පාපොච්චාරණ පිළිබඳ සඳහන් බවත්, සැකකරුවකු කරන පපොච්චාරණයකදී ඔහුට බලපෑමක් තියෙනවාද, ස්වේච්ඡාවෙන් ප්‍රකාශය කරනවාද යන්න බලනවා යන්නත් සඳහන් විය. සැකකරුවෙකු නොවන අයෙකුගේ ප්‍රකාශයක් ගනිද්දී පාපොච්චාරණයකදී මෙන් ක්‍රමවේදයක් අනුගමනය කළේ නැති බවටත් සඳහන් කරන ලදී.

ප්‍රකාශ දෙන ලද පුද්ගලයන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලෑස්ති කරන ලද නීතිඥවරුන්ය යන්න පිළිබඳ දැනීමක් තිබ්බේද යන්න සාක්ෂිකාර විනිසුරුතුමන්ගෙන් විමසන ලද අවස්ථාවේදී, එතුමන්ට එවන් දැනීමක් නොතිබූ බවටත් සඳහන් කරන ලදී. එලෙස දැනුවත්භාවයක් තිබ්බේ නම් තමන්ගේ නිලමැදිරියේ නීතිඥවරුන්ට සිටීමට ඉඩ නොදෙන බවටත්, එසේ නම් පෞද්ගලිකව සාක්ෂිකරුගෙන් විමසා ප්‍රකාශය සටහන් කරගන්නා බවටත් සඳහන් කරන ලදී.

රහස්‍ය ප්‍රකාශයේ අන්තර්ගත කරුණු මාධ්‍යවලින් විකාශනය වූ බැවින් එය පරික්ෂා කරන්න පැවසූ බවටත්, කෙසේ නමුත් මාධ්‍යවල විකාශය වූයේ ප්‍රකාශ සටහන් කළ සාක්ෂිකරුවන් ප්‍රකශ කරන ලද ඒවා නොවන බවටත්, එමෙන්ම සැකකරුවන්ගේ නීතිඥවරුන්ගේ ඉල්ලීම මත කොළඹ අපරාධ කොට්ඨාසය මේ පිළිබඳ විමර්ෂණයක් කළ බවටත්, කෙසේ නමුත් මෙම තොරතුරු මාධ්‍යට ගියේ කොහොමද යන්නට අධිකරණය

සැහීමට පත්වන වාර්තාවක් ලැබුණාද යන්න සාක්ෂිකාර විනිසුරුතුමන් වෙත මතකයක් නොමැති බවටත් සඳහන් කරන ලදී.

මොහොමඩ් මලික්ගේ ප්‍රකාශයට අවධානය යොමු කරමින් ප්‍රශ්න විමසන ලදී. එමෙන්ම ඌණතා පිළිබඳද මෙහිදී සඳහන් විය.

අනතුරුව දෙවන විත්තිකරු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීම සිදු විය.

මනෝහාරි නීතිඥවරයා පින්තූර පෙන්වා ඔවුන්ව අඳුරාගන්න යනුවෙන් මොහොමඩ් මලික්ගේ ප්‍රකාශය දීමේදී කිවුවේද යන්න විමසීමේදී, එලෙස යමක් සිදු නොවූ බව සඳහන් කරන ලදී. එමෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාහන වලින් ප්‍රකාශ දුන් තැනැත්තන් පැමිණි බව තමන් දැන නොසිටි බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙලෙස තමන් ඉදිරියේ ප්‍රකාශයක් ලබා දීමට කටයුතු කිරීමේදී මෙය අනවශ්‍ය වැඩක් බව සාක්ෂිකාර විනිසුරුතුමන් ප්‍රකාශ කළ බවත්, නමුත් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ එලෙස ප්‍රකාශයක් ලබා දීමට බාධාවක් නොමැති නිසා එලෙස සටහන් කරගත් බවටත් සඳහන් කරන ලදී.

අනතුරුව නැවත ප්‍රශ්න ඇසීම සිදු විය.

මෙහිදී ඌනතාවයක් ලෙස මතු කරන ලද කරුණක් පිළිබඳ ගැටලු සහගත තත්වයක් ඇති විය. රජය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා සඳහන් කරන ලද්දේ, සටන් කිරීම හා කරාතේ ඉගෙනීම අතර ළඟ සම්බන්ධතාවයක් ඇති බවයි. කෙසේ නමුත්, සටන් කිරීම හා කරාතේ ඉගෙනීම අතිශයින්ම වෙනස් කරුණු දෙකක් ලෙස සාමාන්‍ය ව්‍යවහාරයේදී පවතින බව අවසානයේදී තීරණය විය.

මීළඟ නඩු දිනය සඳහා 24, 31, හා 38 යන පැමිණිල්ලේ සාක්ෂි අංක දරණ සාක්ෂිකරුවන් සඳහා සිතාසි නිකුත් කරන ලෙස දැන්වීය.

වැඩිදුර නඩු විභගය සඳහා මෙම නඩුව 2024 මාර්තු 1 වන දින කැඳවීමට නියම කරන ලදී.

3. **Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) -** මෙදින මෙම නඩුව නිරීක්ෂණය කිරීම සඳහා කතෝලික පියවරුන් සහ කන්‍යා සොහොයුරියන් පැමිණ සිටීම විශේෂ නිරීක්ෂණයක් විය. ඔවුන් නීතිඥ හිජාස් හිස්බුල්ලා මහතාට සහය දක්වමින් පැමිණ සිටීමත් විශේෂිත තත්ත්වයකි.

4. **Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2024 වර්ෂයේ මාර්තු මස 01 වන දින වැඩිදුර විභාගය සඳහා නියම කරන ලදී.

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**

https://x.com/hejaazh/status/1747113622621544550?t=7jj35eDiseZwU2l091Qzmg&s=08

https://x.com/Justice4Hejaaz/status/1747116998478438522?t=8vKTYWMix_H_wvATJ1klvA&s=08

https://x.com/Justice4Hejaaz/status/1747235190890762296?t=QyBaw2BVrFatXAFAYt6ggA&s=08

https://x.com/Justice4Hejaaz/status/1747235187308773838?t=GKxYubbc65cEIDiN_0e67Q&s=08

https://x.com/Justice4Hejaaz/status/1747235181273178579?t=n5gd3jhO-P9Uks_F5QH6NA&s=08

https://x.com/hejaazh/status/1747224072482853234?t=puIMziolJwIzhliJyV37SA&s=08